# සිහල ජනදිවිය හා බැඳුනු දිය

**රෝෂිණී රඹුක්වැල්ල**
**පර්යේෂණ නිළධාරිණී.**
**අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**ස්වභාව ධර්මයේ මහඟු දායාදයක් වන ජලය, රසායන විද්‍යාඥයන් විසින් ඔක්සිජන් හා හයිඩ්‍රජන් වායුවේ සම්මිශ්‍රනයක් ලෙස ද, භූගෝල විද්‍යාඥයන් විසින් ගංගා, ඇළ දොළ, මූහුදු ඇති වීමේ මූල ධාතුව ලෙස ද, ආර්ථික විශේෂඥයන් විසින් යම් යම් කාර්යයන් ඉටු කිරීමේ දී යෙදෙන බලයක් ලෙස ද, විවිධාකාරයෙන් හැඳින් වූව ද, මිනිසුන්, සතුන් සහ ශාකවල ජීවය, ජලය ලෙස හැඳින්වීම වඩාත් උචිත වන්නේ සියළු ජීවී කොටස්වල ජීවය රැදා පැවැත්මට ජලය අත්‍යාවශ්‍ය වන නිසාවෙනි.**

සිංහල ජන ජීවිතය හා ජලය අතර ඇත්තේ දැඩි සම්බන්ධතාවයකි. ජීවිතයක උපතේ පටන් මරණය දක්වාම බොහොමයක් කටයුතු සඳහා ජලයේ දායකත්වය දක්නට ලැබේ. මෙහි දී එදිනෙදා අවශ්‍යතා පිරිසිදු කිරීමේ කාර්යයන්, පානීය අවශ්‍යතාවයන් හැර, අන් කටයුතු සඳහා ජලයෙහි බද්ධවීම හුදෙක් චාරිත්‍ර - වාරිත්‍ර, ආගමික, සංස්කෘතිය හා බැදී පැවතෙන්නකි.

සිංහල ගැමි සමාජයේ ජලය යනු සුබ වස්තුවකි. ජලය, දිය, වතුර, පැන්, යන විවිධාකාර නම් වලින් හැඳින් වුව ද, ජලය සෞභාග්‍යමත්භාවයේ, පවිත්‍රතාවයේ සංකේතයක් සේ සැලකේ. යම් සුබ කටයුත්තකට පිටත්වීමේ දී, එසේ පිටත්වන පුද්ගලයා ඉදිරියට, දිය පිරි කළයක් හෝ භාජනයක් රැගෙන පැමිණීම වර්තමානයේ පවා දැකිය හැකිය. නිවසේ ඉදිරියෙහි දියපිරි මැටි භාජනයක් සුදු මල් දමා තිබීම ද සුලභ දසුනකි. පවිත්‍රත්වය, සෞභාග්‍යමත්භාවය හා සශ්‍රීකත්වය විදහා පෑමේ දී, මුල්ම සංකේත වූයේ වැව, දාගැබ, කෙත්වතු වැනි දෑ ය. පිරිසිදු දියපිරි ඇලක්, දොලක්, වැවක් පමණක් නොව දිය පිරුණු භාජනයක් පවා සුබ දසුනක් සේ සැලකීමෙන් ගම්‍ය වන්නේ ජලය, මිනිස් ජීවිත සමඟ කොතරම් දුරට බද්ධ වී පවතී ද යන කාරණාවයි. සිංහල ජන චාරිත්‍ර - වාරිත්‍රයන්හි දී ද, බොහොමයක් කටයුතු සඳහා ජලය උපයෝගී කර ගැනේ. යම් උත්සව අවස්ථාවකදී හෝ විශේෂ අවස්ථාවකදී, කෑමට - බීමට ආරාධනා කරනු ලබන්නේ දිය පිරුණු වීදුරු යොදා ගැනීමෙනි.

සිංහල අවුරුදු දිනයේ **නොනගතය** අවසන් වීමත් සමඟ පිරිසිදු දිය පිරුණු කළයක් හෝ භාජනයක් පළමුවෙන්ම නිවසට ගැනීමෙන්, මුළු වසර පුරාම හිඟයකින් තොරව ජලය ලැබෙන බවත්, නිවසට සෞභාග්‍ය ළඟා වන බවත් විශ්වාස කෙරේ. එලෙස දිය ගැනීමේදී දිය ලබාගන්නා ළිඳට හෝ ස්ථානයට කාසියක් මල් හෝ අඟුරු කැබැල්ලක් දැමීමෙන් කෘතගුණ සැලකීමක් සිදුවෙයි. මෙම කරුණ ළිඳ සමඟ ගනුදෙනු කිරීම නමින් හැඳින්වේ. විවාහ මංගල්‍යක දී විවාහපත් යුවලගේ දැඟිලි එක් කොට කෙන්ඩියකින් අත - පැන් වත් කිරීමක් සිදු වේ. මෙමඟින් ගම්‍ය වන්නේ කාන්තාවගේ පියා හෝ ඥාතියෙකු විසින් අත - පැන් වත්කොට ඇය, ස්වාමියාට පවරාදීමකි. පුරාණ ඉතිහාස ජාතික කථා පොත්වල **වෙස්සන්තර රජු විසින් සිය සුදු ඇතා වෙනත් රාජ්‍යයකට දන් දීමේ දී කෙන්ඩියකින් පැන් වත්කොට පවරාදීම සිදුකල බව පැවසේ.** එමෙන්ම, විවාහ මංගල්‍යයක දී මනාලියගේ නිවසට පැමිණෙන මනාලයාගේ දෙපා සේදීමේ චාරිත්‍රයක් පවතී. පා සේදීම තුළින් අපේක්ෂා කරන්නේ මනාලිය රැගෙන යාමට බාධාවක් නොමැති බවත් ඔහු සිය පවුලේ කෙනෙකු සේ භාරගන්නා බවට ඇඟවීමත් ය.

ආගමික කටයුතු වලදී ද, ජලයේ භාවිතය වැදගත් ය. බුද්ධ පූජා පැවැත්වීමේ දී දානය හෝ ගිලන්පස සමඟ පැන් භාජනයක් තැබීම අනිවාර්ය වූ අංගයකි. දානයක් පැවැත්වෙන අවස්ථාවන්හි දී සහ අවමංගල්‍යයක අවසන් කටයුතු කිරීමේ දී, මළ ගිය අය වෙනුවෙන් පින් පැමිණවීම සඳහා පැන් කෙන්ඩියකින් තවත් භාජනයකට පැන් වත්කොට උතුරා යාමට සලස්වයි. මෙමඟින් අපේක්ෂා කරන්නේ එම පින් මළ ගිය ප්‍රාණකාරයා වෙනුවෙන් අනුමෝදන් කරවීමයි. මෙය පැන් වැඩීම සේ හැඳින් වේ. යම් අපල - උපද්‍රව මඟ හරවා ගැනීමට මෙන්ම යම් යම් අපේක්ෂා මුදුන් පමුණුවා ගැනීමේ අරමුණින් ද බෝධි පූජා පැවැත්වීමේ දී, පැන් කල වලින් බෝධිය නැහැවීම සිදු කරනු ලබයි. පිරිතක් හෝ බණක් සඳහා පැමිණෙන හාමුදුරුවන්ගේ දෙපා සේදීම ද සිංහල බෞද්ධ ජනයා අතර පැවතෙන චාරිත්‍රයකි. එසේම, පිරිත් සජ්ජායනාවක් පැවතෙන විට, පැන් කළයක් පිරිත් මණ්ඩපය තුළ තැබෙයි. පිරිත අවසානයේ කළයේ පැන්, රැස් වූ අය අතර බෙදා හැරෙයි. මේවා පිරිත් පැන් ය. පිරිත් පැන්වල, පිරිතෙහි බලය රැඳී ඇති බවක් විශ්වාස කෙරේ. පුරාණ කාලයේ පා ගමනින් හෝ කරත්ත වලින් ගමනාගමනයේ යෙදුන මිනිසුන්, පිපාසාව සංසිඳුවා ගත්තේ මඟ දෙපස තැන් තැන්වල තබා ඇති දිය පිරි භාජන වලිනි. ඒ ඒ පෙදෙස්වල වාසය කරන්නවුන් විසින් එසේ පිරිසිදු දිය පිරුණු බඳුන් මඟ දෙපස තබන ලද්දේ මගීන්ගේ පිපාසය සංසිඳුවීමේ පරමාර්ථයෙනි. එමඟින් තමන්ට පින් ලැබෙන බව විශ්වාස කළ නිසා එය පිංතාලිය සේ හැඳින්වෙයි. මිනිසුන්ට ඇතිවන ඇතැම් ලෙඩ රෝග ආදිය සඳහා ද, ඇස්වහ, කටවහ දෝෂ නම් වන නොයෙක් අපල

- උපද්‍රව උදෙසා ද, වතුර මැතිරීම සිදු කෙරෙයි. බොහෝ විට ඉන්දියාවේ පැවතෙන ක්‍රමයක් වන මියගිය අයගේ මිනී අළු ජලයේ පාකර හැරීම සිංහල ජන සමාජයේ ද යම් යම් ස්ථානවල වර්තමානයේ පවා සිදු වේ. පුද්ගලයෙකුගේ අවසන් මොහොතේ දිය පොදක් මුවට දැමීම, එම පුද්ගලයාට කෙරෙන සැලකිල්ලක් සේ මතයක් පවතී. පුද්ගලයෙකුගේ අවසන් මොහොතේ පවා ජලය සමඟ ඇති සබැඳියාව මෙමඟින් ගම්‍ය වේ.

ජීවිතයේ බොහෝ කටයුතු වල දී ජලය සමඟ බැඳී පැවතෙන කලා කටයුතු උදෙසා ද එහි සම්බන්ධතාවය වැදගත් කොට සලකයි. බොහෝ ඉපැරණි කලා කැටයම් වල ජලය සංකේතවත් වූයේ එනිසාවෙනි. දළදා මාලිගාවේ ඇති දියරැලි බැම්ම, වැවක දියරැලි ඉස්මතු වන සේ සකසා ඇති අතර බොහෝ පුරාණ දාගැබ් තැනීමේ දී දිය බුබුලක ස්වරූපය ඉස්මතු වන සේ සකස් කොට තිබේ. මේවා බුබ්බුලාකාර චෛත්‍ය සේ හැඳින්වෙයි. එමෙන්ම, පැරණි නගර නිර්මාණයන්හි දී ද, මලින් පිරී ගිය දිය පොකුණු ඉදිකිරීමෙන් ද මේ බව ගම්‍ය වේ.

මිනිස් දිවියේ ආගමික, සංස්කෘතික චාරිත්‍ර - චාරිත්‍ර වලට අමතරව ප්‍රධාන ජීවනෝපාය වන කෘෂිකාර්මික කටයුතු සඳහා ජලයේ වැදගත්කම කිව නොහැකි තරම් ය. ස්වභාවික ඇළ- දොළ, ගංගා හීලෑ කොට ගනිමින්, එය තම කෘෂිකාර්මික අවශ්‍යතා සඳහා යොදා ගැනීම ආදී කාලීන පරපුරේ සිටම පැවතෙන්නකි. **අනුරාධපුර, පොළොන්නරුව** වැනි ඊසාන දිග මෝසම් වර්ෂාව ලැබෙන වියළි කලාප වලට වියළි කාලයන් සඳහා ජලය රැස් කරගැනීමේ අවශ්‍යතාවය මත වාරිමාර්ග කටයුතු ඇරඹෙන්නට විය. පුරාණයේ රජවරු විසින් විශාල ජලාශ තැනවූයේ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජලය සැපයීමේ ප්‍රධාන අරමුණ පෙරදැරි කොට ගෙනය. ඒ තුළින් දේශීය කෘෂිකාර්මාන්තය නංවා රට ස්වයංපෝෂිත මට්ටමකට ගෙන ඒම අපේක්ෂාව විය. ඉපැරණි ජලාශයක් වන **අභය වැව** ඉදිකරනු ලැබූවේ **පණ්ඩුකාභය රජු** විසිනි. විවිධ කාලවකවානු වල විවිධ රජවරුන් විසින් ඉදිකරන ලද වැව් අමුණු රාශියකි. **වසභ රජු** විසින් වැව් එකොළහක් (11) සහ ඇළවල් විශාල සංඛ්‍යාවක් ඉදිකරන ලදී. මින්නේරි දෙවියෝ යන ආරූඪ නමින් හැඳින් වූ **මහසෙන් රජු** ද කෘෂිකාර්මික කටයුතු උදෙසා වැව් අමුණු රාශියක් ඉදිකරවන ලදී. කලාවැව, **ධාතුසේන රජු** විසින් ඉදිකරනු ලැබූ අගනා හෙළ උරුමයකි. වැව් - අමුණු ඉදි කෙරූ මහ රජුන් අතරින් **මහා පරාක්‍රමබාහු රජුට** හිමි වන්නේ අග්‍රගන්‍ය ස්ථානයකි. **පරාක්‍රම සමුද්‍රය** එතුමා විසින් ඉදිකරන ලද මහඟු දායාදයකි. පුරාණ සමාජයේ, වැව්-අමුණු, ඇළවල්, ඉදිකරනු ලැබූ රජවරුන් සැබෑ දෙවිවරුන් සේ සැලකූහ. වියළි කලාපයේ ආදිවාසීන් විසින් **මහසෙන් රජු** මින්නේරි දෙවියෝ යන ආරූඪ නාමයෙන් හැඳින්වීම එයට සාධකයකි. එසේ ජලාශ ඉදි කෙරූ රජවරුන් දෙවියන් සේ සැලකුවා පමණක් නොව, එම වැව්, අමුණු, ජලාශ දෙවියන් සේ රැක බලාගැනීමට පුරාණ ගැමියා උනන්දු විය. එපමණටම තමා දිය ලබාගන්නා ළිං අවට කුඹුක් වැනි ගස් සිටුවා එම උල්පත් ආරක්ෂා කරගැනීමේ කාර්යයන් හි නිරත විය. මන් ද, ජලය ඔවුන්ගේ සම්පත විය. එහි වටිනාකම ආදිවාසී හෙළ සමාජය විසින් හොඳින් දැන හඳුනාගෙන තිබුණි.

මෙසේ ඉපැරණි සමාජයේ පැවති ජලය සමඟ බද්ධ වීමේ ක්‍රම, ක්‍රම ක්‍රමයෙන් වෙනස් වුව ද, මිනිස් ඉතිහාසයේ පටන් මේ වනතුරාම ලෝකයේ සියළුම ජීවී කොටස් වලට, අත්‍යාවශ්‍යම සම්පතක් සේ ජලයේ වැදගත්කම නොවෙනස්ව පවතී. භාවිතා කරන්නන්ගේ සංඛ්‍යාව පමණක් නොව, ජලය භාවිතයෙන් සිදු කරන නොයෙකුත් ක්‍රියාකාරකම් ද දිනෙන් දින වැඩිවෙමින් පවතින බව පෙනේ. මෙසේ ජලය යන මහඟු සම්පත දිනෙන් දින හීන වී යන තර්ජනයකට මුහුණ පා තිබේ. වන සම්පත් විනාශය මෙන්ම නොයෙකුත් ආකාරයෙන් සිදුවන ජල දූෂණය ද මීට හේතු පාදක වේ. ඉපැරණි සිංහල ගැමි සමාජය පණ මෙන් සුරැකි ජල සම්පත ක්‍රම ක්‍රමයෙන් විනාශය කරා යාමත් සමඟ මුළු මිනිස් සංහතියේම විනාශය, නොදැනුවත්වම ඔවුන් කරා පැමිණීමේ දී, ඊට වගකිව යුත්තෝ මිනිසුන්ම නොවේද?

**ආශ්‍රිත ග්‍රන්ථ**


"Water In Culture", "The Sri Lankan Heritage" J.B. Dissanayake



# ගොවි ජනතා - ඉදිරි කලාප.....

- මල් සහ විසිතුරු පැලෑටි
- කෘෂි කාර්මික අලෙවිකරණය
- කිරි සහ කිරි ආශ්‍රිත කර්මාන්ත
- කාබනික ගොවිතැන

ඉහත තේමාවන් යටතේ ලියැවෙන ලිපි සඳහා ඔබට ද දායක විය හැකිය. ඔබගේ ලිපි ඒ 4 තනි පිටුවෙහි ලියා පහත සඳහන් ලිපිනයට අප වෙත ලැබෙන්නට සැලැස්විය හැකිය.

**සංස්කාරක**
**ගොවිජනතා,**
**ප්‍රවෘත්ති හා ප්‍රකාශන ඒකකය,**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,**
**114, විජේරාම මාවත,**
**කොළඹ 07.**